චක්‍රලේඛ අංක :- 27/2017

මගේ අංක ඩබ්/08/බලපත්‍ර/2017,
සිරකරු පුනරුත්ථාපන අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2017.12.26

සියළුම බන්ධනාගාර අධිකාරීන් /සහකාර අධිකාරීන් වෙත,

**<u>සිරකරුවන් බලපත්‍රමත මුදාහැරීම සහ නිවාස නිවාඩු යැවීම.</u>**

සිරකරුවන් බලපත්‍රමත මුදාහැරීම සහ නිවාස නිවාඩු යැවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති මගේ අංක ඩබ්/08/බලපත්‍ර හා 2011.12.05 දිනැති 25/2011 චක්‍රලේඛය මින් අවලංගු කරමි.

2018.01.01 දින සිට පහත සදහන් වර්ගීකරණය හා කොන්දේසි වලට යටත්ව සිරකරුවන් බලපත්‍ර මත මුදා හැරීම සදහා තෝරාගත යුතු බව දන්වා සිටිමි.

01. සිර දඩුවම් නියම වී වසර 02ක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගතව සිටි සිරකරුවන් පමණක් බලපත්‍ර මත නිදහස් වීම සලකා බලනු ලැබේ.

02. අවුරුදු 30ට අඩු සිර දඩුවම් ලැබූවන් සාමාන්‍ය සමාව සහිතව නිදහස් වීමට නියමිත දිනයෙන් හරි අඩක් සම්පූර්ණ කරන දිනය බලපත්‍ර මත නිදහස් වීමට සුදුසුකම් ලබන දිනය විය යුතුය.

03. අවුරුදු 30 හෝ ඊට වැඩි සිර දඩුවම් ලැබූවන් බලපත්‍ර මත මුදා හැරීමට සුදුසුකම් ලැබීම සදහා අවුරුදු 10ක සිරදඩුවම් කාලයක් ගෙවා තිබිය යුතුය.

04. ස්ත්‍රීදූෂණ හා ළමා අපචාර චෝදනා සම්බන්ධයෙන් සිරදඩුවම් ලැබූවන්, ඔවුන්ගේ පූර්ව ක්‍රියා කලාපය පරිදි වරදේ අල්ප බව හෝ බරපතලකම, වරදට පෙළඹවීම, වරදට අදාල වින්දිත පාර්ශවයේ වර්ථමාන පසුබිම සහ සිරකරුගේ ආකල්ප ගැඹුරින් සැලකිල්ලට ගනිමින් බලපත්‍ර මත මුදාහැරීම සිදුකල යුතුය.

05. මත්ද්‍රව්‍ය යටතට ගැනෙන ගංජා, අබිං, හා නීති විරෝධී මත්පැන් යන චෝදනාවන්ට සිරදඩුවම් ලැබූවන් පමණක් බලපත්‍ර මත මුදා හැරීම සිදු කළ යුතු අතර හෙරෝයින් හා හශිස් ඇතුළු වෙනත් මත්ද්‍රව්‍ය වැරදිවලට සිරදඩුවම් ලැබූවන් බලපත්‍ර මත මුදා හැරීම සිදු නොකල යුතුය.

06. මින් පෙර බලපත්‍ර මත මුදාහල සිරකරුවන් නැවත බන්ධනාගාරගත වීමේදී එම සිරකරුවන් නැවතත් බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නුසුදුස්සන් වෙති.

07. බලපත්‍ර මත නිදහස් වීමට සුදුසුකම් ලබන සිරකරුවන්ගේ නාම ලේඛණය සුදුසුකම් ලබන දිනයට මාස 06 ට පෙර සිර ලියාපදිංචි කිරීමේ අංශයෙන් සකස් කර පිටපතක්

පුනරුත්ථාපන නිලධාරී වෙත ලබා දී මුල් පිටපත ලේකම්, බලපත්‍ර මණ්ඩලය වෙත එවිය යුතු අතර, මින් ඉදිරියට එම ලේඛණයේ පිටපතක් සිරකරුවන්ගේ දැනගැනීම සඳහා ද ප්‍රදර්ශනය කිරීමට ලියාපදිංචි අංශය විසින් ක්‍රියාකල යුතුය. එසේම බලපත්‍ර මත නිදහස් වීමට නිර්දේශ වුවන්ගේද, නිවාස නිවාඩු යැවීමට නිර්දේශ වුවන්ගේද විස්තර ද සිරකරුවන්ගේ දැනගැනීම සඳහා සහ අභියාචනා ඇත්නම් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට ක්‍රියාකල යුතුය.

08. පුනරුත්ථාපන නිලධාරීන් විසින් මෙම කටයුතු වලට වඩාත් ප්‍රමුඛත්වයක් දියයුතු අතර සමාජ වාර්ථා ගොනු නියමිත දිනට බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්නේදැයි අවධානයෙන් සිටීමට අධිකාරීවරුන් වගබලා ගතයුතු බවද, ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන සමාජ වාර්ථා ගොනු සම්බන්ධයෙන් ප්‍රමාදයට හේතු දැක්විය යුතු බවද මෙයින් දන්වමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

**<u>පිටපත:</u>**

ඉංජි. පොන්නයියා සුරේෂ් මහතා,
ලේකම්,
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්තාපන නැවත - පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.
කොල්ලුපිටිය. — කාරුණික දැනගැනීම සඳහා